

ශ්‍රී ලංකාවේ දකුණේ පිහිටි අපේ ගම සාමාන්‍ය වශයෙන් ගත් කල මඳ උගතුන් සහිත සීමිත ජනගහණයකින් යුතු පිටිසර ගමක් ලෙස නම් කල හැක. එක් එක් නිකාය නියෝජණය කරන පංසල් කිහිපයකුත් ගමේ පාසලත් ගමේ ක්‍රියාකාරීකම් පාලනය කරන ප්‍රධාන යාන්ත්‍රණයන් ලෙස හැඳින්විය හැක. මීට අමතරව ග්‍රාම සංවර්ධණ සංගමයත් කිසියම් මෙහෙවරක' ඉටුකිරීමට හැකි ආයතනයක් වුවද තම තමාගේ පෞද්ගලික කෙරුවාවන් ප්‍රදර්ශණය කිරීමට කෑදර උදවිය අරක' ගැනීම නිසාවෙන් එය අකාර්යක්ෂම ආයතනයක් බවට පත්වී ඇති බවක් දකින්නට ඇත. තවත් නොයෙකුත් සංගම් විවිධ නම් වලින් මෑතක සිට බිහිවුනද මේවායේ යථා අරමුණ පැහැදිලි නැත. මෙවැනි එක් සංගමයක් කොළඹ සිට ගමේ පාසලට පැමිණ ගමේ පදිංචිවූ ඉංග්‍රීසි ගුරුවරයාත් තැපල් මහත්තයාත් අටවා ගත් සංගමයයි. එහි අනෙක් සාමාජිකයන් වූයේ කොළඹ පාසලක

විජයසිරි තිලකුමාර
බ්‍රස්බේන්

අධ්‍යාපණය ලබන රාලහාමිගේ පුතාත් රාලහාමිට බැලු මෙහෙවරකම් කරණ ගමේ නූගත් තරුණයන් කිහිප දෙනෙකුත් පමණි.

ගමේ කවුරුත් සභාපති මාමා නැතිනම් සභාපති උන්නැහේ ලෙස හඳුන්වන සියාතු, මෙම සෑම ආයතනයකම පාහේ කාලයක් තිස්සේ දකිත හැකි චරිතයකි. මෙම සෑම සංගමයකම ඇලි ගැලි වැඩ කිරීමට නො-පැකිලෙන සභාපති මාමා, එසේ කරන්නේ තමාට සභාපති හෝ වෙනත් තනතුරක් ලැබුනහොත් පමණි. තනතුරක් නොලද වහාම ඊනියා සංගමයේ වරදක් දකින සභාපති මාමා, වෙනත් ඊට ප්‍රතිවිරුද්ධ සංගමයකට මුක්කු ගසන්නේ කිසිම විලිසංගයක් නැති කෙනෙකු ලෙස පමණක් නොව තමාගේ පිල් මාරුව සාධාරණී කරනය කිරීමට කිසියම් තර්කයක්ද ඉදිරිපත් කරමිනි. මේ නිසාම ගමේ කොලුරු ල සියාතුට සභාපති මාමා යන උපහාසාත්මක අන්වර්ථ නාමය පටබැඳිමුත් සියාතුට නම් එය ආඩම්බරයට හේතුවක් වී ඇත.

එක පංසලකින් ඈත් වී අනෙක් පංසලක දායකයෙකු වන සභාපති මාමා, එම පංසලේ හාමුදුරු පරම්පරාවට තමාගේ පරම්පරාවේ සම්බන්ධ කමක් කොහෙන් හෝ සොයාගනී. එහෙත් සියලු වෙනස්වීම්වල යථ අරමුණ වන්නේ තනතුරක් ලබාගැනීමය. සමහර අය සභාපති මාමාගේ මෙම පුරුද්ද තම වාසියට හරවාගෙන සභාපති මාමා ගොනාට අන්දවා වැඩ ගන්නා බව ගම පුරා කටින් කට පැතිරුන ප්‍රසිද්ධ රහසකි.

සභාපති මාමා ගේ වැඩ කටයුතුවලට නොමඳව සහාය දෙන්නේ, කොල්ලෝ කුරුට්ටෝ උපහාසයෙන් පණිත්කියා යනුවෙන් හඳුන්වන ගමේ එකම බාබර් උන්නැහේය. බාබර් උන්නැහේ හොඳින් කොණ්ඩය කපා රැ වුල බා පවුඩර් දා අත්දිගට හැඳ ගමන් බිමන් යාමට නුරුපුරුදුව ඇත. ගමේ පිං කමක සංවිධානය සභාපති මාමා බාරගන්නාවිට ලවුඩ් ස්පීකරයෙන් එය ගම පුරා ප්‍රචාරය කිරීම බාරගන්නේ බාබර් උන්නැහේය. මෙම කාර්ය බාබර් උන්නැහෙගේ සිතට බොහොම තේජස ලංකරන රාජකාරියකි. මේ දෙදෙනාගෙන්ම යමෙකු සමාජ සේවය කරන් නේ නම්බුව සඳහා නේදැයි ඔලොක්කුවට වගේ ඇසුවොත් ලැබෙන උත්තරය වන්නේ, මහන්සිවෙලා වැඩ කරන කොට නම්බුව ටිකක් සෙවීම සාධාරණ බවයි.

වරක් සභාපති මාමා ග්‍රාම සංවර්ධණ සංගමයේ සභාපති තණතුර දරන කාලයේ, අනෙක් අයට ඔවුන් ගෙන් ගමට ඉටුවුන උසස් සේවය සඳහා සම්මාණ පදවි දීමට තීරණය කල අතර, තමාටද ඉහලම සම්මාණයක් නම් කරගැනීමට පසුබට නොවීය. ඔහු ඒකමතිකව ගත් එම තීරණයට සාමා-ජිකයෝ විරුද්ධවීම නිසා මාමාට කේන්ති ගියත් ග්‍රාම සංවර්ධණ සංගමයෙන් ඉවත්වීම පාඩුයයි බාබර් උන්නැහේ දුන් උපදෙස් මත මතු බලාපො-රොත්තු ඇතිව සභාපති මාමා ග්‍රාම සංවර්ධණ සංගමයේ රැ ඳී සිටීමට තීරණය කලේය.

ඉංග්‍රීසි ගුරුවරයාත් තැපල් මහත්තයාත් අටවා ගත් සංගමයට ද වරින් වර සභාපති මාමා යන නමුදු මාමාට එම සංගමයේ තණතුරක් ලබාගැනීම අසීරු වී ඇත්තේ ඔහුගේ ඉංග්‍රීසි කථාව හොර නිසා යැයි සභාපති මාමා බාබර් උන්නැහේට කියනු අසා සිටි අයෙකු ගම පුරා පවසා ඇත. එහෙත් ගමේ කොලුරු ල නම් කියන්නේ සභාපති මාමාට ඉංග්‍රීසි කථාව හොර නොව බැරි බවය. එහෙත් සභාපති මාමා කියන්නේ රෑ ඉංග්‍රීසි පාසලේ ඉගෙන ගත් ඔහුට හොඳින් ඉංග්‍රීසි කථාව හුරු බවය. කෙසේ වෙතත් වැඩවසම් ක්‍රමයෙත්, යටත් විජිත පාලනයේත් නශ්ධාවශේෂ වශයෙන් ඇති ඉංග්‍රීසි ගුරුවරයාත් තැපල් මහත්තයාත් අටවා ගත් සංගමයේ තනතුරක් ලබාගැනීමට සභාපති මාමා ගේ ඉංග්‍රීසි අඩුපාඩුවට අමතරව ගමේ රාලහාමිගේ අතකොළුවක් බවට පත් සංගමයක සභාපති මාමා වැනි අයට කිසි තැනක් නැති බවද පැහැදිලිය. උට්ඨාන වීර්යයෙන් යුතු සභාපති මාමා අඩුම වශයෙන් හදිස්සියකට රෙදිගෑම් එකක් වත් කියවා දෙන්න සිටින තැපල් මහත්තයා සිටින සංගමයේ සමාජිකව සිටීම කිසියම් නම්බුවක් නිසා ද? එම සංගමයටද වරින් වර යයි. ඒත් ගමේ කොල්ලෝ කියන්නේ ජොනී වැඩ හැර වැදගත් යමක් සභාපති මාමාට එම සංගමයෙන් නොලැබෙන බවකි.

සභාපති මාමා සහ බාබර් උන්නැහේ ගේ මෙම නම්බු පෙරේත උට්ඨාන වීර්යය සමහරුන් මෝඩ කමක් ලෙසත් තවත් සමහරෙක් කපටි කමක් ලෙසත් හඳුන්වා දෙති. සභාපති මාමා ට යතා වේදි තතාකාරීය ඇති හෙයින් ඔහු බුද්ධිමතකු වියයුතු යයි මම අදහමි. මට හැඟෙන අයුරු සභාපති මාමාට නැත්තේ බුද්ධිය හෝ අධ්‍යාපණයට වඩා විඥේදානය විය යුතුය. කෙසේ වෙතත් සභාපති මාමා සහ බාබර් උන්නැහේ වැන්නන් ක්‍රමයෙන් අභාවයට යන සමාජ ක්‍රමයක අවසන් පුරුක් වන අතර අපට නොමිලේ විනෝදය සපයන නිසාත් අභාවයට යන සත්ව විශේෂ සුරැ කීම වත්මන් පරම්පරාවේ යුතුකම නිසාත් උපේක්ෂාවෙන් අගය කලයුතු නැද්ද !

සූරියා
SOORIYA
ශ්‍රී ලාංකික ඔබේ වෙළඳසල

22 Lorne Street Lalor Vic 3075
Tel 03 9402 5380 Melway 9B6

THE KINGDOM OF RAIGAM®
21 වන සියවසේ රැජිණිය සමාගම
www.raigam.lk
Sri Lanka
Raigam

රයිගම් නම් කවදත් කොතැනත් හරිම රසයි!
දැන් අළුත් රස රැසක්!

Try New Fried & Devel Cuttle Fish Soy TVP and New String Hopper Flour
(now you don't have to use boiling or hot water to make string hopper mix/dough! ඇළ් වතුරෙන් අනන්න!)

Raigam – Premium Quality Food Manufacturers from Sri Lanka.
Raigam – A trusted brand for taste and uncompromised quality.

Raigam Soy, Noodle Meal Kits, Vinegar, String Hopper Rice Flour, Dehydrated Vegetables, Coffee, Spices & Raigam Biscuits.
Sole Agents in Australia & New Zealand:
E-Techno Enterprises, Essendon, Victoria
Tel:03-9370 3813 Fax orders: 03-9337 9468
Email:sales@etechno.com.au July 2006

සන්නස සාහිත්‍ය තරගාවලිය 2007

නිර්මාණ බාරගන්නා අවසාන දිනය 2007 අප්‍රේල් 30

පසුගිය කළාපයේ නිර්මාණ එවිය යුතු ලිපිනය සඳහන්ව තිබුණේ වැරැදියට ය. නිවැරදි ලිපිනය පහත දැක්වෙයි. කරුණාකර ඔබේ නිර්මාණ පහත ලිපිනයට එවන්න.

විවෘත අංශය
වයස් සීමාවකින් තොරව ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට විවෘත අංශයට සහභාගි විය හැකි ය.

කෙටි කතා පොදු කොන්දේසි
1 කෙටි කතා සඳහා වචන සීමාවක් නැත.
2 තමන්ට කැමති තේමාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති නිර්මාණ සංඛ්‍යාවක් හැකි ය.
4 කෙටිකතාව තමාගේම නිර්මාණයක් බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් මග එවිය යුතුය.

කාව්‍ය නිර්මාණ පොදු කොන්දේසි
1 වචන සීමාවක් නැත
2 තමන්ගේ අභිමතය පරිදි සඳැස් හෝ නිසඳැස් නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති සංඛ්‍යාවක් නිර්මාණ ඉදිරිපත් කිරීමට අවසර ඇත.
4 නිර්මාණය තමන්ගේම බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් සමගම එවිය යුතුය.

සියළුම අංශ සඳහා පොදු කොන්දේසි
1 සෑම නිර්මාණයක්ම **පිටපත් තුනකින්** යුතුව එවිය යුතු ය.
2 තරගයට ඉදිරිපත් කරන නිර්මාණ මෙයට පෙර ප්‍රකාශිත ඒවා නොවිය යුතු ය.
3 තරගයට එවන නිර්මාණ නැවත ආපසු එවීමට හැකියාවක් නැති බව සළකන්න.
4 නිර්මාණ බාරගන්නා අවසාන දිනය **2007 අප්‍රේල් 30** වෙයි.
5 තරගය පිළිබඳ මතුවන ගැටළු වලදී සන්නස සංස්කාරකගේ තීරණය අවසන් තීරණය බව සළකන්න. සන්නස වාර්ෂික සාහිත්‍ය තරගය 2007
Sannasa 22 Lorne Street Lalor Vic 3075